සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2024
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2024
General Certificate of Education (Adv. Level) Examination, 2024

යුරෝපා ඉතිහාසය II (II කොටස)
ஐரோப்பிய வரலாறு II (பகுதி II)
History of Europe II (Part II)

25 B | S | II

## යුරෝපා ඉතිහාසය - ග්‍රීක-රෝම අවධියේ සිට ක්‍රි.ව. 1989 දක්වා

**උපදෙස්:**
- පිළිතුරු සැපයිය යුතු **මුළු** ප්‍රශ්න සංඛ්‍යාව **හතරකි.**
- **II කොටස A, B** හා **C** ලෙස කොටස් **තුනකින්** සමන්විත වේ.
- **A කොටසේ** ප්‍රශ්නය අනිවාර්ය වේ.
- **B** හා **C කොටස්වලින්** එක් කොටසකින් අවම වශයෙන් **එක** ප්‍රශ්නයක්වත් තෝරා ගෙන **තවත්** ප්‍රශ්න **තුනකටත්** පිළිතුරු සපයන්න.

(**පළමුවන** ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා **යුරෝපයේ දළ සිතියමක් I කොටස** සමඟ සපයා ඇත.)

## A කොටස

1. ඔබට සපයා ඇති සිතියමේ පහත සඳහන් **සියලු ම ස්ථාන ලකුණු කොට නම් කරන්න.**

| | | |
|---|---|---|
| (i) බෝල්ටික් මුහුද | (ii) කෝසිකා | (iii) ඇතන්ස් |
| (iv) ස්පාඤ්ඤය | (v) ඩැනියුබ් ගඟ | (vi) ලන්ඩන් |
| (vii) ඩාඩනල්ස් සමුද්‍ර සන්ධිය | (viii) උතුරු මුහුද | (ix) ඉස්තාන්බුල් |
| (x) ශාන්ත පීටර්ස්බර්ග් | (xi) ඩැන්සිග් | (xii) කීල් ඇළ |

(නිවැරදි ව ලකුණු කිරීමට හා නම් කිරීමට ලකුණු **01** බැගින්)

## B කොටස

2. (i) පුරාණ රෝමවරුන් අතර පැවති විවිධ ආණ්ඩුක්‍රමවල දක්නට ලැබුණ ප්‍රධාන ලක්ෂණ පරීක්ෂා කරන්න. (ලකුණු 08 යි)

   (ii) සාහිත්‍යය සහ ගෘහ නිර්මාණ ශිල්පය යන ක්ෂේත්‍රවල පුරාණ රෝමවරුන්ගේ ප්‍රධාන කාර්ය සාධනයන් පරීක්ෂා කරන්න. (ලකුණු 08 යි)

3. "දේශ ගවේෂණ වූ කලී විවිධාකාර වූ ආර්ථික, දේශපාලන සහ ආගමික හේතු සමූහයක ප්‍රතිඵලයකි."

   (i) දේශ ගවේෂණවලට මුල පිරූ අයිබීරියානු රටවල් **දෙක** නම් කරන්න. (ලකුණු 02 යි)

   (ii) එම රටවල මුල්කාලීන ගවේෂණවලට අනුග්‍රහය දැක්වූ පාලකයන් **දෙදෙනෙකු** නම් කරන්න. (ලකුණු 02 යි)

   (iii) එම රටවල් අතුරෙන් **එකක්** නිරත වූ මුල්කාලීන ගවේෂණ සැකෙවින් දක්වන්න. (ලකුණු 03 යි)

   (iv) පහළොස්වන සියවසේ දෙවන භාගයේ දී හා දහසයවන සියවසේ මුල් භාගයේ දී ඇති වූ දේශ ගවේෂණවලට තුඩුදුන් ප්‍රධාන ආර්ථික, දේශපාලන හා ආගමික හේතු විචාරාත්මකව විමසන්න. (ලකුණු 09 යි)

4. (i) 'කාර්මික විප්ලවය' යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 02 යි)

   (ii) කාර්මික විප්ලව සමයේ දී බිහි වූ ප්‍රධාන නව උත්පාදන සැකෙවින් දක්වන්න. (ලකුණු 04 යි)

   (iii) කාර්මික විප්ලවය එංගලන්තයේ ඇතිවීමට තුඩුදුන් ආර්ථික හා සමාජ තත්ත්වයන් විශ්ලේෂණය කරන්න. (ලකුණු 10 යි)

[අනෙක් පිටුව බලන්න.

Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!

5. පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳව කෙටි සටහන් ලියන්න.
   (i) බටහිර රෝම අධිරාජ්‍යයේ බිඳවැටීම
   (ii) ඉතාලි පුනරුදය ඇති වූ පසුබිම
   (iii) ප්‍රති රෙපරමාදුව
   (iv) තිස් අවුරුදු යුද්ධය

(ලකුණු 08 × 2 = 16 යි)

## C කොටස

6. "ආඥාදායක පාලනයක් ගෙනගිය ද නැපෝලියන් බොනපාර්ට් ප්‍රංශ විප්ලවයේ ප්‍රධාන කාර්ය සාධනයන් ආරක්ෂා කළේ ය, ශක්තිමත් කළේ ය, ඒ අතර ම ඒවා වෙනත් රටවලට ගෙන ගියේ ය."
   (i) නැපෝලියන් බොනපාර්ට් උපන් ස්ථානය නම් කරන්න. (ලකුණු 01 යි)
   (ii) නැපෝලියන් බොනපාර්ට් බලයට පත්වීමට පෙර විප්ලව සමයේ ප්‍රංශයේ පැවති **එක්** ආණ්ඩු ක්‍රමයක් නම් කරන්න. (ලකුණු 01 යි)
   (iii) නැපෝලියන් බොනපාර්ට් ප්‍රංශයේ පාලකයා බවට පත් වූ ආකාරය සැකෙවින් දක්වන්න. (ලකුණු 04 යි)
   (iv) නැපෝලියන් බොනපාර්ට් ප්‍රංශයේ ක්‍රියාත්මක කළ දේශීය ප්‍රතිපත්තිය විවේචනාත්මකව විමසන්න. (ලකුණු 10 යි)

7. (i) 1815 සිට 1848 දක්වා කාලය තුළ ඉතාලිය එක්සත් කිරීමට එරෙහිව පැවති බාධක විස්තර කරන්න. (ලකුණු 06 යි)
   (ii) ඉතාලිය එක්සත් කිරීමෙහි ලා කැවූර් සහ ගැරිබෝල්ඩි විසින් ඉටුකරන ලද කාර්යභාරයන් පරීක්ෂා කරන්න. (ලකුණු 10 යි)

8. සුපිරි බලවතුන්ගේ නැගී ඒම කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් දෙවන ලෝක යුද්ධයෙන් පසුව උදා වූ තත්ත්වය විග්‍රහ කරන්න. (ලකුණු 16 යි)

9. පහත සඳහන් මාතෘකා අතුරෙන් ඕනෑම **දෙකක** ඓතිහාසික වැදගත්කම පිළිබඳව කෙටි සටහන් ලියන්න.
   (i) යුරෝපා සම්මේලන ක්‍රමය
   (ii) වයිමාර් සමූහාණ්ඩුව
   (iii) ජෝශෆ් ස්ටාලින්
   (iv) තුෂ්ණී යුද්ධය

(ලකුණු 08 × 2 = 16 යි)

* * *

PAST PAPERS WIKI

WWW.PastPapers.WiKi

Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!